# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2429/12 - 2025 මාර්තු මස 25 වැනි අඟහරුවාදා - 2025.03.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**එල්. ඩී. බී. 9/2016 (iv)**

**2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත**

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද (මේ නියෝගවල "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ඖෂධ නියාමන අධිකාරියේ මිල නියම කිරීමේ කමිටුව, 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සහ සියලු පරදු දරන්නන් විමසා සහ 2003 අංක 9 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ විධිවිධාන ඇතුළු වෙනත් සියලු අදාළ සාධක පිළිබඳ සැලකිල්ලට ගෙන 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වන වගන්තියේ (4) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

වෛද්‍ය **නලින්ද ජයතිස්ස** (පා.ම.),
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය.

2025 මාර්තු මස 25 දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2025 අංක 01 දරන ඖෂධ (ඖෂධ සඳහා වන මිල නිර්ණය කිරීමේ ක්‍රමවේදය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මිල නිර්ණය කිරීමේ ක්‍රමවේදයට, (මෙහි මින්මතු "MRP" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් තනි නිෂ්පාදනයකට (ප්‍රාරම්භකය, වෙළඳ නාමයෙන් හෝ ඖෂධීය නාමයෙන් හඳුන්වනු ලබන) අදාළ වූ උපරිම සිල්ලර මිල සඳහා වන මිල නිර්ණය කිරීමේ ක්‍රමවේදය ද (මෙහි මින්මතු "MCP" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් නිශ්චිත ඖෂධයක හෝ යම් නිශ්චිත ඖෂධ කාණ්ඩයක මාත්‍රා ආකාරයට සහ ප්‍රබලතාවට අදාළ වූ උපරිම ඉහළම සීමා මිල සඳහා වන මිල නිර්ණය කිරීමේ ක්‍රමවේදය ද ඇතුළත් වේ.

3. යම් නිශ්චිත ඖෂධයක මිල නියාමනය කිරීම සඳහා අදාළ කරගත යුත්තේ MRP ද *නැතහොත්* MCP ද යන්න අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## I වන කොටස

## උපරිම සිල්ලර මිල (MRP) සඳහා වන මිල නිර්ණය කිරීමේ ක්‍රමවේදය

4. පහත දැක්වෙන සූත්‍රයට අනුව MRP ගණනය කරනු ලැබිය යුතු ය-

$$MRP = CIF + DT + SCTM$$

MRP යන්නෙන්, යම් තනි නිෂ්පාදනයකට (ප්‍රාරම්භකය, වෙළඳ නාමයෙන් හෝ ඖෂධීය නාමයෙන් හඳුන්වන) අදාළ වූ උපරිම සිල්ලර මිල (දේශීය ව්‍යවහාර මුදලින්වූ) දැක්වේ;

CIF යන්නෙන්, පිරිවැය, රක්ෂණ සහ භාණ්ඩ ප්‍රවාහන අගය (දේශීය ව්‍යවහාර මුදලින් වූ) දැක්වේ;

SCTM යන්නෙන්, සැපයුම් දාමයට අදාළ මුළු එකතු කළ ලාභය (දේශීය ව්‍යවහාර මුදලින් වූ) දැක්වේ;

DT යන්නෙන්, ගෙවන ලද තීරුබදු සහ බදු (දේශීය ව්‍යවහාර මුදලින් වූ) දැක්වේ.

5. ආනයනකරුවකු විසින් ප්‍රකාශයට පත් කරන ලද පිරිවැය, රක්ෂණ සහ භාණ්ඩ ප්‍රවාහන අගය (CIF) අධිකාරිය විසින් බාහිර සහ අභ්‍යන්තර ආශ්‍රේය මිල නිර්ණය කිරීමේ ක්‍රම භාවිත කරමින් තහවුරු කරනු ලැබිය යුතු ය.

6. MRP නිශ්චය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ විනිමය අනුපාතිකය මත පදනම්ව අධිකාරිය විසින් පළ කරන ලද පසුගිය මාස තුන සඳහා වන එක්සත් ජනපද ඩොලර් විනිමය (විකුණුම්) අනුපාතික අගයන්ගේ සාමාන්‍යය සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

7. තීරුබදු සහ බදු කිසිවක් වෙතොත්, එකී තීරුබදු සහ බදු සැලකිල්ලට ගනු ලැබිය යුතු අතර, එය ශ්‍රී ලංකා රුපියල්වලින් වූ පිරිවැය, රක්ෂණ සහ භාණ්ඩ ප්‍රවාහන අගයේ (CIF) ප්‍රතිශතයක් ලෙස නිරූපණය කරනු ලැබිය හැකි ය.

8. ශ්‍රී ලංකා රුපියල්වලින් වූ සැපයුම් දාමයට අදාළ මුළු එකතු කළ ලාභය (SCTM) පහත දැක්වෙන පරිදි CIFහි ප්‍රතිශතයක් ලෙස ප්‍රකාශ කරනු ලැබිය යුතු ය:-

$$SCTM = (\beta\% CIF)$$

$\beta\%$ තනි අගයක් (තනි කොටසක්) වශයෙන් හෝ ක්‍රමයෙන් අඩුවන අගයන් (බහු කොටස්) වශයෙන් හෝ ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

9. අධිකාරිය විසින්, වර්ෂයකට දෙවතාවක් MRP සමාලෝචනය කරනු ලැබිය හැකි ය:

එසේ වුවද, පිළිගත් ඉඩදිය හැකි මට්ටමක් ඉක්මවා විනිමය අනුපාතිකයේ උච්චාවචනයක් සිදුව ඇත්තා වූ ද, එසේ කිරීම මහජන යහපත පිණිස අවශ්‍ය යයි අධිකාරිය විසින් සලකනු ලබන්නාවූ ද අවස්ථාවක, අධිකාරිය විසින්, MRP ප්‍රතිශෝධනය කරනු ලැබිය හැකි ය.

10. අධිකාරිය විසින්, වෙළඳපොළ තත්ත්වයන් මත පදනම්ව නිකුත් කරන ලද MRP අගයන් අවලංගු කිරීම ද, එමෙන්ම, ඖෂධ වෙත ප්‍රවේශ වීම වැඩිදියුණු කිරීම සඳහා, එකී අගයන් වෙනුවට අලුත් MRP අගයන් ආදේශ කිරීම ද නීත්‍යානුකූල විය යුතු ය.

## II වන කොටස

### උපරිම ඉහළම සීමා මිල (MCP) සඳහා වන මිල නිර්ණය කිරීමේ ක්‍රමවේදය

11. (අ) යම් නිශ්චිත ඖෂධයක විවිධ වෙළඳ නාම හෝ ඖෂධීය නාම වර්ගවලට අදාළ වෙළඳපොළ කොටසේ වටිනාකම හඳුනාගැනීම සඳහා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් තොරතුරු මූලාශ්‍ර භාවිතා කිරීම;

(ආ) දිවයිනේ විවිධ ප්‍රදේශවල සිල්ලර ඔසුසල්වලින් සහ ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව විසින් සපයනු ලබන තොරතුරුවලින් යම් නිශ්චිත ඖෂධයක මාත්‍රා ආකාරයට සහ ප්‍රබලතාවට අදාළ වන සිල්ලර මිල ගණන් තහවුරු කිරීම; සහ

(ඇ) අභ්‍යන්තර ආශ්‍රේය මිල ගණන්, බාහිර ආශ්‍රේය මිල ගණන් සහ සැපයුම් දාමයට අදාළ මුළු එකතු කළ ලාභය භාවිත කිරීම,

මගින් MCP නිශ්චය කරනු ලැබිය යුතු ය.

12. පහත දැක්වෙන සංඛ්‍යානමය ක්‍රමවේදයට අනුව MCP ගණනය කරනු ලැබිය යුතු ය-

(අ) අධිකාරිය විසින් නිශ්චය කරන ලද පරිදි වූ සැලකිය යුතු වෙළඳපොළ කොටස් වටිනාකමක් ඇති, එකී නිශ්චිත ඖෂධ කාණ්ඩයට අයත් එකී ඖෂධයේ ප්‍රාරම්භකය ද ඇතුළුව යම් නිශ්චිත ඖෂධ කාණ්ඩයකට අයත් යම් නිශ්චිත මාත්‍රා ආකාරයකින් සහ ප්‍රබලතාවකින් වූ ඖෂධයකට අදාළ සියලු වෙළඳ නාම සහ ඖෂධීය නාම වර්ග සම්බන්ධයෙන් වූ සියලු සිල්ලර මිල ගණන් පිළිවෙළට සකස් කිරීමෙන්;

(ආ) (අ) වන ඡේදයේ සඳහන් පරිදි සිල්ලර මිල ගණන් සකස් කිරීමෙන් පසු, එකී ඖෂධවල මධ්‍යස්ථ සිල්ලර මිල පහත දැක්වෙන පරිදි නිශ්චය කරනු ලැබිය යුතු ය:-

(i) ඖෂධයේ පවත්නා සියලුම තනි නිෂ්පාදන (ප්‍රාරම්භකය, වෙළඳ නාමයෙන් හෝ ඖෂධීය නාමයෙන් හඳුන්වන) වර්ග සංඛ්‍යාව (n) ඔත්තේ අගයක් ගන්නා අවස්ථාවක, එකී ඖෂධයේ මධ්‍යස්ථ සිල්ලර මිල, (n+1)/2ට අනුරූප අගය ලෙස සලකනු ලැබිය යුතු ය;

(ii) ඖෂධයේ පවත්නා සියලුම තනි නිෂ්පාදන (ප්‍රාරම්භකය, වෙළඳ නාමයෙන් හෝ ඖෂධීය නාමයෙන් හඳුන්වන) වර්ග සංඛ්‍යාව (n) ඉරට්ටේ අගයක් ගන්නා අවස්ථාවක, එකී ඖෂධයේ මධ්‍යස්ථ සිල්ලර මිල, n/2 සහ (n/2)+1 යන අවස්ථාවලට අනුරූප වන අගයන්හි සාමාන්‍යය අගය ලෙස සලකනු ලැබිය යුතු ය;

(iii) (i) සහ (ii) අනු ඡේද යටතේ වන එකී ඖෂධවල මධ්‍යස්ථ සිල්ලර මිල නිශ්චය කිරීමේ කාර්යය සඳහා, "n" යනු සමුච්චිත ලෙස (අ) වන ඡේදයේ සඳහන් වෙළඳපොළ කොටසේ වටිනාකම ඇති, එම නිශ්චිත ඖෂධයේ පවත්නා මුළු තනි නිෂ්පාදන (ප්‍රාරම්භකය, වෙළඳ නාමයෙන් හෝ ඖෂධීය නාමයෙන් හඳුන්වන) වර්ග සංඛ්‍යාව ලෙස සලකනු ලැබිය යුතු ය.

13. යම් ඖෂධයක් අලෙවි කරනු ලබන යම් තැනැත්තකු විසින්, MCPට වැඩි මිලකට එකී ඖෂධය අලෙවි කරනු නොලැබිය යුතු ය.

14. අධිකාරිය විසින් නිශ්චය කරන ලද පරිදි වූ තනි නිෂ්පාදනයක ප්‍රාරම්භකයද ඇතුළුව එහි සියලු වෙළඳ නාම හෝ ඖෂධීය නාම වර්ගවලට අදාළ වූ MRP අගයන් MCP අගයට අඩු වන අවස්ථාවක, එකී MRP අගයන් වැඩි කරනු නොලැබිය යුතු ය.

15. කලින් MRP නිශ්චය කර නොමැති තනි නිෂ්පාදනයක් අලුතින් ලියාපදිංචි කිරීමක් හෝ නැවත ලියාපදිංචි කිරීමක් සම්බන්ධයෙන් වන විට, එහි ගණනය කරන ලද MRP අගය MCP අගයට වැඩි වන අවස්ථාවක, එකී නිෂ්පාදනයට අදාළව නිශ්චය කරන ලද MRP අගය විය යුත්තේ MCP අගය වේ.

16. කලින් MRP නිශ්චය කර නොමැති තනි නිෂ්පාදනයක් අලුතින් ලියාපදිංචි කිරීමක් හෝ නැවත ලියාපදිංචි කිරීමක් සම්බන්ධයෙන් වන විට, එහි ගණනය කරන ලද MRP අගය MCP අගයට අඩු වන අවස්ථාවක, එකී නිෂ්පාදනයට අදාළව නිශ්චය කරන ලද MRP අගය විය යුත්තේ MRP අගය වේ.

17. අධිකාරිය විසින් වෙළඳපොළ තත්ත්වයන් මත පදනම්ව සහ එමෙන්ම, ඖෂධ වෙත ප්‍රවේශවීම වැඩිදියුණු කිරීම සඳහා, නිකුත් කරන ලද MCP ප්‍රතිශෝධනය කිරීම නීත්‍යානුකූල විය යුතු ය.

18. අධිකාරිය විසින්, 11 වන නියෝගයේ සඳහන් මිල නිර්ණය කිරීමේ ක්‍රමවේදයට අනුව නිශ්චය කරන ලද යම් නිශ්චිත ඖෂධ කාණ්ඩයක මාත්‍රා ආකාරයට සහ ප්‍රබලතාවට අදාළ වූ MCP *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

19. අධිකාරියේ මිල නියම කිරීමේ කමිටුවේ නිර්දේශය මත, අධිකාරිය විසින්, මිල නිර්ණය කිරීමේ ක්‍රමවේදයට අදාළ (විනිමය අනුපාතිකයේ උච්චාවචන සඳහා වන බීටා සහ ඉඩදිය හැකි මට්ටම් ද ඇතුළුව) නිශ්චිත අගයන් සහ පැහැදිලි කිරීමේ සටහන් සැලකිල්ලට ගෙන, ඒ සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය යුතු ය.

20. මේ නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු විසින් වරදක් සිදු කරනු ලබන අතර, 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 131 වන වගන්තිය යටතේ එම තැනැත්තාට එරෙහිව අධිකරණය ඉදිරියෙහි නඩු පවරනු ලැබිය යුතු ය.

21. මේ නියෝගවල කාර්යය සඳහා -

"වෙළඳ නාමය" යන්නෙන්, එක් නිෂ්පාදන බලපත්‍රධාරියකුගේ ඖෂධය අනෙකුත් නිෂ්පාදන බලපත්‍රධාරීන්ගේ ඖෂධවලින් වෙන්කර හඳුන්වා දෙනු ලබන යම් නාමයක්, පදයක්, මෝස්තරයක්, ලකුණක්, වෙළඳ ලකුණක් හෝ වෙනත් යම් අංගයක් අදහස් වේ.

"වෙළඳපොළ කොටසේ වටිනාකම" යන්නෙන්, යම් ලිත් වර්ෂයක් තුළ දී යම් ඖෂධයක වෙළඳ නාමයක හෝ ඖෂධීය නාම වර්ගයක වල වාර්ෂික පිරිවැටුම සහ ලිත් වර්ෂයක් තුළ දී දේශීය වෙළඳපොළෙහි අලෙවි කරන, එකම ප්‍රබලතාව සහ මාත්‍රා ආකාරය සහිත එම ඖෂධයේ සියලුම වෙළඳ නාම සහ ඖෂධීය නාම වර්ගවල මුළු දේශීය විකුණුම් වටිනාකම මත පදනම් වූ දේශීය විකුණුම් වටිනාකම් අනුපාතය අදහස් වේ; සහ

"සිල්ලර මිල" යන්නෙන්, අවසානයේ පාරිභෝගිකයාට ඖෂධය අලෙවි කරනු ලබන්නා වූ ද, ඇසුරුමේ සඳහන් වූ ද, අදාළ බදු සහ තීරුබදු ඇතුළත් වූ සිල්ලර මිල හෝ උපරිම මිල අදහස් වේ.

EOG 03 - 0234

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.